# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## 2026/2027 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ආපනශාලා සේවා සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

## කොන්ත්‍රාත් අංකය : TRC/ADM/01/24/04/01

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 දරන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය සඳහා 2026/2027 වර්ෂයට අදාළ වසරක කාලයක් වෙනුවෙන් ආපනශාලා සේවා ප්‍රසම්පාදනය කිරීම පිණිස යෝග්‍ය සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට මෙම ප්‍රසම්පාදනයට අදාළ වැඩිදුර විස්තර අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08, දරන ස්ථානයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන හා ආයතනික කටයුතු අංශයේ අධ්‍යක්ෂ / පාලන හා ආයතනික කටයුතු වෙතින් ලබා ගත හැකිය. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2026.08.14** සිට **2026.08.28** දක්වා සතියේ රාජකාරි දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා, රු. 5,000.00 ක ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවා, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08, පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, සිංහල භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.

**"මුල් පිටපත"** සහ **"අනුපිටපත"** ලෙස සකස් කරන ලද, නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු කට්ටල දෙකක්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2026/2027 වර්ෂය සඳහා ශ්‍රී.ල.වි.ස.නි.කො. සභා ප්‍රධාන කාර්යාලයේ ආපනශාලා සේවා සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය"** යනුවෙන් සඳහන් කර, 2026.08.31 දින ප.ව. 2.00 ට හෝ එදිනට පෙර පාලන සහ ආයතනික කටයුතු අංශය , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන සහ ආයතනික කටයුතු අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම කළ හැකිය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, **2026.08.31** දින ලංසුකරුවන් හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. නියමිත අවසන් වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රමාද වූ ලංසු ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතු වේ.

**සභාපති ,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ,**
**276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**

2026.08.14